නෙත් FM

# 5 පහේ පන්තිය

**01** ''මම පහනක් වගේ ලෝකයට එළිය දෙන්නෙමි'' මෙය සුවපත් වීමේ ක්‍රියාකාරකමේ කුමන පියවරට අයත් ද?

(1) අධිෂ්ඨානය (2) ප්‍රාර්ථනාව (3) උදානය

**02** ජාතික කොඩියේ බෝපත් සතරින් නියෝජනය වන්නේ,

(1) සතර බ්‍රහ්ම විහරණ (2) සිංහල ජාතියයි (3) ජාතික අභිමානයයි

**03** රාජ්‍ය ලාංඡනයේ දැකිය හැකි සංකේතයක් නොවේ.

(1) වී කරල් (2) මුරගල (3) ධර්ම චක්‍රය

**04** ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වන්නේ,

(1) ඇටිකුකුළා (2) හබන්කුකුළා (3) වලිකුකුළා

**05** අවුරුද්දේ එක කාලයකට පමණක් මල් පිපෙන ශාකයකි.

(1) බිනර (2) අරලිය (3) පොල්

**06** මල්වල පැණි බීමට පමණක් පැමිණෙන සතුන් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කුඹලා, දිමියා, බඹරා (2) සමනලයා, බට්ටිච්චා, වන්දා (3) සමනලයා, මී මැස්සා, බඹරා

**07**



මෙම චිත්‍රය දැකිය හැකි ස්ථානය කුමක් ද?

(1) ගාලු කොටුව (2) ඉසුරුමුණිය (3) සීගිරිය

PAPERMASTER.LK

**08** සුළඟේ පාවී ඈතට යන බීජයකි.

(1) පුලුන් (2) පොල් (3) පුවක්

**09** විවිධ වර්ණ ශාක පත්‍ර සහිත ශාකයකි.

(1) පොල්පලා (2) කුප්පමේනිය (3) කෝලියාස්

**10** බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක දෙකක ප්‍රධාන නගර දෙකකි.

(1) කොළඹ - කළුතර (2) ගම්පහ - කෑගල්ල (3) කළුතර - ගාල්ල

**11** සිංහල ජනතාව බහුල ව ගන්නා ආහාරයකි.

(1) ඉට්ලි (2) කිරිබත් (3) වඩේ

**12** ආහාරයට ගන්නා මල් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) වද, කුඩලු (2) ගෝවා, කෙසෙල් (3) බෙලි, රණවරා

**13** 

මෙම උපකරණයෙන් කරන කාර්යය කුමක් ද?

(1) සිදුරු විදීම (2) නියනට තට්ටු කිරීම (3) යතුගෑම

**14** කනට පමණක් තොරතුරු ලැබෙන මාධ්‍යයකි.

(1) ගුවන් විදුලිය (2) රූපවාහිනිය (3) පුවත්පත්

**15** අපිරිසිදු ජලය පානය කිරීමෙන් වැළඳෙන රෝගයකි.

(1) ස්ථූලතාව (2) අම්ලපිත්ත රෝගය (3) වකුගඩු රෝගය


**16** මින්නේරිය වැව ඉදි කළ රජතුමා කවු ද?

(1) ධාතුසේන රජු (2) මහසෙන් රජතුමා (3) දෙවන අග්බෝ රජතුමා

**17** නිෂ්පාදිත දිනය හා කල් ඉකුත්වීමේ දිනය අතර අඩු ම කාලයක් ඇති ආහාරය තෝරන්න.

(1) මුදවපු කිරි (2) බටර් (3) අයිස්ක්‍රීම්

**18** මෙම උපකරණයෙන් ලැබෙන ප්‍රයෝජනය කුමක් ද?



(1) සුළඟේ වේගය මැනීම

(2) සුළං හමා එන දිශාව දැන ගත හැකි වීම

(3) උතුරු දිශාව සොයා ගැනීම

**19** ශරීරය ලෙඩ රෝගවලින් ආරක්ෂා කරන ආහාරයකි.

(1) ආප්ප (2) මස් (3) නෙල්ලි

PAPERMASTER.LK

**20** අපට ජලය ලැබෙන ස්වාභාවික ක්‍රමයකි.

(1) ගඟ (2) වැව (3) ජල නළය

**21** ජලයෙන් කරන කර්මාන්තයකි.

(1) ධාන්‍ය ඇඹරීම (2) විදුලිය නිපදවීම (3) ලී භාණ්ඩ සෑදීම

**22** හිරු එළිය ඇති ස්ථානයක ගසක අත්තක් විනිවිද පෙනෙන පොලිතින් ආවරණයකින් වැසූ විට ,


(1) අත්ත මැල වී යයි. (2) පොලිතින් කවරයේ පිටත ජල බින්දු තැන්පත් වේ.

(3) පොලිතින් කවරයේ ඇතුළත ජල බින්දු තැන්පත් වේ.

**23** ලුණු දමා කල් තබා ගන්නා දෙයකි.

(1) දෙහි (2) කුරුඳු (3) ගම්මිරිස්

**24** චුම්බක ළං කර ඇති අවස්ථා දෙකක් දී ඇත. එම අවස්ථා දෙකෙහි දී සිදුවන දේ දැක්වෙන පිළිතුර තෝරන්න.




(1) ආකර්ෂණය හා ආකර්ෂණය (2) විකර්ෂණය හා ආකර්ෂණය (3) ආකර්ෂණය හා විකර්ෂණය

**25** ක්ෂණික ආහාර, තෙල් මිරිස් අධික ආහාර ගැනීම හා නියමිත වෙලාවට ආහාර නොගැනීම නිසා හටගන්නා රෝගයකි.

(1) අම්ලපිත්ත රෝගය (2) අධිරුධිර පීඩනය (3) දියවැඩියාව


**26** පින්සිදු වන්නේ අනේ....බාල ළමුන්නේ.... යන ගීතයෙන් කියවෙන්නේ කාගේ සිතුවිලි ද?

(1) මී මැස්සෙකුගේ (2) බළලකුගේ (3) කුරුල්ලෙකුගේ

**27** පෘථිවියට රෑ දහවල් ඇති වන්නේ,

(1) පෘථිවි භ්‍රමණය නිසා ය. (2) පෘථිවිය සූර්යයා වටා ගමන් කරන නිසා ය. (3) පෘථිවිය විශාල නිසා ය.

**28** විද්‍යුත් චුම්භකයක් දී ඇත. එහි ඇණය වටා ඔතා ඇති කම්බිය කුමක් ද?



(1) යකඩ

(2) තඹ

(3) ඇලුමිනියම්

**29** ජලය දූෂණය වන ආකාරයක් නොවන්නේ,

(1) පළිබෝධ නාශක, රසායනික පොහොර ජලයට එකතු වීම

(2) තෙල් පිරිපහදුවලින් පිටවන අපද්‍රව්‍ය ජලයට එකතු වීම

(3) ඉවත දමන ජලය පිරිසිදු කර නැවත භාවිත කිරීම

**30** රතු සහ නිල් වර්ණ මිශ්‍ර වීමෙන් සෑදෙන වර්ණය කුමක් ද?

(1) දම් (2) කොළ (3) තැඹිලි

PAPERMASTER.LK